**වාරියපොළ ප්‍රාදේශීය සභාව - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වාරියපොළ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වාරියපොළ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පැවරුම් නියෝග යටතේ ලැබී තිබූ අක්කර 5 රූඩ් 2 ක් වූ ඉඩම් 04 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේදී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබූ රු.1,000,084 ක් වටිනාකම වූ පුස්තකාල පොත් 2,544 ක් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි. | | පුස්තකාල පොත් මිලදී ගැනීම ප්‍රාග්ධනිත කළයුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවල ඉඩම් වෙන්දේසිවලින් සභාවට පැවරු වටිනාකම රු.5,849,600 ක් වූ ඉඩම් 15 ක් ගිණුම්ගත කර නොතිබුණි. | | පොදු කටයුතු සඳහා සභාවට ලබාදුන් ඉඩම් ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනයට දරා තිබුණු වටිනාකම රු.6,637,920ක් වටිනා වත්කම් 07 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | හිඟ ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවලට අදාළව කර්මාන්ත හා ව්‍යාපෘති වෙනුවෙන් ලැබිය යුතු රු.485,785 ක් වටිනා ණයගැති ශේෂ 04 ක් ගිණුම්ගත කර නොතිබුණි. | | |
| (ඊ) | ඉකුත් වර්ෂවලට අදාළව ලැබිය යුතු මුද්දර ගාස්තු ශේෂය රු.6,811,883 ක් වුවත් එය රු.4,213,292ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.2,598,591 ක් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසානයට නළළිං තැන්පත් ගිණුමේ ශේෂය රු.241,593 ක් වුවත් එය රු.139,337 ක් ලෙස රු.102,256 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබූ අතර රු.3,102,977 ක් වටිනා කර්මාන්ත ඇප තැන්පත් ගිණුම්ගතකර නොතිබුණි. | ලේඛණ යාවත්කාලීන කර නිවැරදි කරන බව දන්වා සිටිමි. | |

**1.7** අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 219 වගන්තිය | මෙම වගන්තියේ ප්‍රතිපාදන වලින් බැහැරව සේවකයින් දෙදෙනෙකු සමිතියක් පිහිටුවා එම සමිතියේ සභාපතිවරයා හා ලේකම් ලෙස කටයුතු කරමින් සභාවේ කොන්ත්‍රාත් ඉටුකිරීමට ගිවිසුම් අත්සන් කර 2021 වර්ෂය තුල පමණක් රු.4,588,838 වටිනාකම වූ කර්මාන්ත 06ක් ඉටුකර තිබුණි. | මේ සම්බන්ධයෙන් පරීක්ෂණ කර විගණනයට කඩිනමින් වාර්තා කරමි. | පනතේ 219 වගන්තියෙන් බැහැරව කටයුතු කරන ලද නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ආ) | 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2:5 වගන්තිය | පවරනු ලබන කොන්ත්‍රාත්තුව ප්‍රජාපාදක සංවිධානයේ බල ප්‍රදේශ සීමාවන් තුළ විය යුතු බව දක්වා තිබියදීත් බල ප්‍රදේශයෙන් පිට රු.2,228,797 ක් වටිනාකම වූ කොන්ත්‍රාත්තු 03 ක් ප්‍රජා මණ්ඩලයකට ලබාදී තිබුණි. | මෙම ඉදිකිරීම සඳහා අදාළ ප්‍රදේශයේ ස්වේච්ඡා සමිති කිසිවක් ඉදිරිපත් නොවීම නිසා ප්‍රදේශයෙන් පරිබාහිරව වාරියපොළ ප්‍රදේශයේ පිහිටි සභාවේ ලියාපදිංචි ප්‍රජාමණ්ඩලයක් වෙත ලබා දීමට සිදුව ඇති බව සඳහන් කරමි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,431,413 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.39,608,022 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

**වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් ඒකක 4457 කින් රු.4,865,584 ක වරිපනම් බදු මුදලක් අයකර නොතිබුණු අතර, අයකර ගැනීමට වැඩ පිළිවෙලක්ද සකස් කර නොතිබුණි. | හිඟ මුදල පියවා ගැනීම සඳහා රතු නිවේදන බෙදා දීමට කටයුතු කර ඇත. | හිඟ ආදායම් කාලීනව අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

**කාර්යය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබවිහරණය හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කටුපොත බහුකාර්ය මධ්‍යස්ථානයේ කඩ කාමර 23 ක් ටෙන්ඩර් කර ඇතත් විදුලි සම්බන්ධතාවය ලබා ගැනීමට ප්‍රමාණවත් පියවරක් ගෙන නොතිබීම හේතුවෙන් 2021 වර්ෂයේ සභාවට අහිමි වූ ආදායම රු.1,753,500 ක් විය. | කටුපොත බහුකාර්ය ගොඩනැගිල්ලේ ජලය හා විදුලිය ලබා දී මෙම වර්ෂයේ සිට එම ආදායම සභාවට ලබාගත හැකි වෙතැයි අපේක්ෂා කරන බව සඳහන් කරමි. | සභාව සතු කඩ කාමර බදු දී ආදායම උපයාගත යුතු වේ. |
| (ආ) | වාරියපොළ නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර ටෙන්ඩර් කර ටෙන්ඩර්කරුවන් තෝරාගෙන ඇතත් කඩ කාමර 19 කින් අයවිය යුතු රු.41,355,000 ක එකවර ගෙවීම් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එකවර ගෙවීමේ මුදල් අය කර ගැනීමට අදාල පාර්ශ්වයන් වෙත ලිපි යවන ලද නමුත් මෙතෙක් නව ගොඩනැගිල්ල ජනසතු කර නොමැති බැවින් බදුකරුවන් මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කර ඇත. | එකවර ගෙවීමේ මුදල් අයකර කඩ කාමර විවෘත කිරීමට කටයුතු කළ යුතු වේ. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාරියපොළ බස් නැවතුම්පොල පරිශ්‍රයේ එළවළු සහ පළතුරු කඩ කාමර ඉදිකිරීම සඳහා රු.3,500,000 ක ඇස්තමේන්තුවක් සකස් කර පෞද්ගලික ආයතනයක් සමඟ 2020 ජනවාරි 20 දින ගිවිසුම්ගත වී තිබුණි. මෙම ව්‍යාපෘතියට අදාලව අත්තිකාරම් සුරක්ෂණයක් ලබා නොගෙන 2020 අප්‍රේල් 29 දින රු.689,808 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබූ අතර, ගිවිසුම්ගතවී එකඟ වූ වටිනාකමෙන් තවදුරටත් ඉතිරි වී ඇති අයිතම 10 ක නිම නොකල වැඩවල වටිනාකම රු.908,466 ක් විය. | කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොමැති බව දන්වමි. රටෙහි පවතින කොවිඩ් වසංගත තත්ත්වය හා ද්‍රව්‍ය මිල විශාල ලෙස ඉහළ යාම හේතුවෙන් මෙම වැඩ විෂයයන් ඉටු කිරීම ප්‍රමාද වී ඇත. | අත්තිකාරම් සුරක්ෂණ සහතිකයක් ලබාගෙන අත්තිකාරම් ගෙවිය යුතු වේ. ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘතිය නිම කළ යුතු වේ. |
| (ආ) | වල්පොල පානීය ජල ව්‍යාපෘතිය දෙවන අදියර යටතේ ගම් 100 යි වැඩ 100 යි ග්‍රාම සංවර්ධන වැඩසටහනේ දෙවන අදියර යටතේ රු.4,878,474 ක ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා වාරියපොළ ප්‍රාදේශීය සභාව වෙත පවරා තිබුණු ඉහත ජල ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ලිපිගොනු සහ භෞතික පරීක්ෂාවේ දී අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂිතයක් ලබා නොගෙන රු.874,741 ක අත්තිකාරම් මුදලක් ගෙවීම් කර තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2021 දෙසැම්බර් 21 දින සිට රු.4,308,220 ක කොන්ත්‍රාත් වැඩ අවසන් කළයුතු වුවත්, විගණිත දිනය වන 2022 පෙබරවාරි 17 දින වන විටත් රු.292,340 ක වැඩ පමණක් අවසන් කර තිබුණි. | * රු.60,000ක ටෙන්ඩර් ඇපතැන්පත් මුදලම, අතපසුවීමක් හේතුකොටගෙන කාර්යසාධන සුරක්ෂණය වෙනුවෙන්ද ලබාගෙන ඇති අතර මින් ඉදිරියට එවැනි අතපසුවීම් ඇති නොවන ආකාරයෙන් කටයුතු කරන ලෙසත් විෂයභාර නිලධාරීන් දැනුවත් කර ඇත.<br>* 2022.05.18 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේදී ඔහුගෙන් කළ විමසීමකට අනුව ඔහු ප්‍රකාශ කළේ රටේ පවතින ආර්ථික අරගලය මත මෙම කටයුත්ත අතපසු වී ඇති බවත් 2022.06.15 දිනට පෙර ව්‍යාපෘතිය අවසන් කර භාරදීමට අවශ්‍ය කටයුතු කරදෙන බවයි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් අනුව කටයුතු කළ යුතු වේ. කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |